**ආණමඩුව ප්‍රාදේශීය සභාව**

**පුත්තලම දිස්ත්‍රික්කය**

**---------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.**

**--------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන, 2015 මාර්තු 31 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 28 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 13 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2 මතය**

**-------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට ආණමඩුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**---------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

**----------------------**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) එකතුව රු.114,297 ක් වටිනා තොග, මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ තැන්පත් රු.14,750 ක් අඩුවෙන් ගිණුම්වලට ගෙන තිබුණි.

(ආ) 2011 හා 2013 වර්ෂවලට අදාලව සමාලෝචිත වර්ෂයේ ලැබී තිබුණු රු.1,705,163 ක මුද්දර ගාස්තු සහ රු.224,331 ක උසාවි දඩ වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කිරීමෙන් වර්ෂයේ ආදායම රු.1,929,494 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) 2013 වර්ෂයට අදාලව ගෙවිය යුතු රු.68,020 ක විශ්‍රාම වැටුප් පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන සලසා තිබියදී ණය හිමියන් යටතේද ප්‍රතිපාදන සලසා තිබීම නිසා වගකීම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) 2013 වර්ෂයේ වැටුප් ගෙවීමට අදාලව රු.49,500 ක ණය හිමියන් යටතේ සාවද්‍ය ලෙස ඉදිරියට ගෙනවිත් තිබීම, සමාලෝචිත වර්ෂයේදී නිවැරදි කර නොතිබුණු අතර වර්ෂයට අදාලව ගෙවිය යුතු රු.45,000 ක් දෙවරක් ගිණුම්ගත කිරීම නිසා ණයහිමියන් එම ප්‍රමාණයන්ගෙන් වැඩියෙන් දක්වා තිබුණි.

**1.3.2 නොසැසඳු පාලන ගිණුම්**

---------------------------

(අ) සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබුණු මූල්‍ය ප්‍රකාශනවලට අනුව හිඟ හිටි වෙනත් ආදායම් වටිනාකම රු.1,023,280 ක් වුවද, උපලේඛන අනුව එය රු.742,058 ක් වීම හේතුවෙන් රු.281,222 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) 2014 වර්ෂය අවසානයට හිඟ හිටි වෙනත් ආදායම් රු.1,023,280 ක් වූ අතර, උපලේඛන අනුව එම ශේෂය රු.742,058 ක් වීමෙන් රු.281,222 ක වෙනසක් නිරීක්ෂණය විය.

**1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-----------------------------------

සමාලෝචිත වර්ෂය අවසානයට රු.30,605,563 ක ලැබිය යුතු හා රු.20,632,231 ක ගෙවිය යුතු ගිණුම් ශේෂයක් වූ අතර, ඒවා තුළ පිළිවෙලින් වසර 03 කට සහ වසර 05 කට වඩා වැඩි රු.4,587,739 ක හිඟ හිටි ආදායම් හා රු.1,083,892 ක ගෙවිය යුතු ශේෂයන් ද ඇතුලත්ව තිබුණි.

**1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

-----------------------------------

ප්‍රමාණවත් සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකිරිම හේතුවෙන් එකතුව රු. 1,628,462 ක් වූ වත්කම් සතුටුදායක ලෙස සත්‍යාපනය කළ නොහැකි විය.

**1.3.5 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම්**

---------------------------------------------------

**පහත නිරික්ෂණයන් කරනු ලැබේ.**

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 129 (2) (අ) සහ (ඊ) වගන්ති ප්‍රකාරව ප්‍රාදේශීය සභාවට ලැබිය යුතු උසාවි දඩ, මුද්දර ගාස්තු හා බදු කුලී යනාදී ආදායම් විධිමත් පරිදි අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර පනතේ 158 වගන්තිය ප්‍රකාරව වරිපනම් බදු ගෙවීම පැහැර හරින්නන්ගේ චංචල දේපල තහනමට ගෙන හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 5(7) හා 65 ප්‍රකාරව පිළිවෙලින් මූල්‍ය හා ගබඩා කටයුතු සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් පවත්වාගෙන යාමටත්,

ගෙවීම් පැහැර හරින තැනැත්තන්ගේ නාම ලේඛනයක් පිළියෙල කර ලේකම් වෙත ඉදිරිපත් කිරීමටත් විධිමත් පියවර ගෙන නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනයන්ට අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.11,583,021 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.4,288,151 ක් විය. සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය තුල ලැබී තිබුණු පිළිවෙලින් රු.10,168,738 ක් හා රු.8,851,306 ක් වූ මූලධන ආධාර හා රු.15,380,479 ක් හා රු.17,591,515 ක් වූ මූලධන වියදම් ගණන් ගැනීමෙන් පසු සමාලෝචිත වර්ෂයේ රු.6,371,280 ක අතිරික්තයක් හා පෙර වර්ෂයේ රු.4,452,059 ක ඌනතාවයක් ඇති වි තිබුණි. ඒ අනුව, පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.10,823,339 ක වර්ධනයක් දක්නට ලැබුණි.

### 2.2 ආදායම් පරිපාලනය

---------------------

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

----------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | 2014 දෙසැම්බර් 31 දිනට විචලනය |
|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 |
| (i). වරිපනම් හා බදු | 2,210 | 2,042 | 168 |
| (ii). බදුකුලී, කඩකුලී | 12,053 | 9,109 | 2,944 |
| (iii). බලපත්‍ර ගාස්තු | 1,138 | 708 | 430 |

සමාලෝචිත වර්ෂය අවසානයට කුලී සහ බලපත්‍ර ගාස්තු ආදායම් හිඟය ඒ සඳහා වූ ඇස්තමේන්තුව හා සසඳන විට පිළිවෙලින් සියයට 24.43 ක් හා සියයට 37.79 ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.2.2 මුද්දර ගාස්තු**

-------------

හලාවත, නිකවැරටිය, පුත්තලම යන අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල තුනෙන් ලැබිය යුතුව පැවති මුද්දර ගාස්තු ගණනය කර ගිණුම් වලට ගෙන නොතිබූ අතර, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අයවැය ලේඛණයෙන් ඇස්තමේන්තු කරන ලද රු.5,000,000 ක මුදල වර්ෂයට අදාල ආදායම ලෙස ගිණුම් වල දක්වා තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

**3.1 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත භෞතික සම්පත්**

-------------------------------------------------

සභාව සතු රු. 597,668 ක් වටිනා ට්‍රැක්ටරය සහ වටිනාකම ගණනය නොකළ මිනි කුබෝටා ට්‍රැක්ටරය දිර්ඝ කාලයක සිට භාවිතයෙන් ඉවත් කර තිබුණි.

3.2 අභ්‍යන්තර විගණනය

----------------------------

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

**4. පද්ධති හා පාලන**

------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වත්කම් කළමනාකරණය

(ඉ) ණයගැති හා ණය හිමි පාලනය